

පදත්ථ භාවාත්ථ නිදානාදිය
සහිත

# කරණීයමෙත්ත සූත්‍ර වර්ණනාව

පදාර්ථ භාවාර්ථ නිදානාදිය

— සහිත —

# කරණීය මෙත්ත සූත්‍ර වර්ණනාව.

කොළඹ ජේතවනා රාමාධිපති

අධිකරණ විනිශ්චය කාරක සඞ්ඝ සභානායක

පාතේගම වල්පිට

සිරිසුමනතිස්ස ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ

— විසින් —

ලියා සකස්කරණලදි.

කොළඹ ජේතවනාරාමයෙහි

— ප්‍රධාන දායක —

ඒ. ඒ. ගබෝසිකෙදෙකා මුදලාලි මහතා

විසින්

ඈපා මුද්‍රණ යන්ත්‍රාලයෙහි මුද්‍රාපිතයි


ශ්‍රී බුද්ධ වර්ෂ 2470.

1926.

# සංඥාපනය.

ජිතරාමර ලෝකශාන්තිකර තථාගත අර්හත් **සම්මා සම්බුදු රජාණන් වහන්සේ** දෙව් බඹුන් සහිත සකල පින්ඇති සකල ලොකවාසීන් සසරසයුරෙන් එතරකොට අමාමහනිවන් පුර පමුණුවාලීම පිණිස සුවාසූ දහසක් ධර්මස්කන්ධය දෙශනා කර වදාලසේක. සූත්‍රාභිධර්මවිනය සංඛ්‍යාත පිටකත්‍රය හා සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණාදි නවාඞ්ග ශාස්තෘශාසනයට ඇතුලත් ඒ මේ ධර්මසමූහය අතුරෙන් **මේ කරණීය මෙත්ත සූත්‍රදෙශනාව** වනාහි සංසාර නිස්තරණාර්ථී භික්ෂු සමූහයකගේ තදර්ථ සිද්ධිය පිණිසද දිව්‍ය සමූහයකට ශාන්තිසුඛාස්වාදනය පිණිසද මෛත්‍රී කර්මස්ථාන ගිරීයෙන් දෙශනාකර වදාරනලදී. පදයක් පාසා දෙව් මිනිසුන්ගේ කණට අමාරස වගුරුවන්නාක් මෙන් ශාන්ති සුඛාවහනය කරවන්නාවූ ඒ මේ සූත්‍ර දෙශනාව ප්‍රථම සංගීති කාරක මහරහතුන් වහන්සේලා විසින් සූත්‍ර පිටකයෙහි සූත්‍ර නිපාතයට ඇතුලත්කොට සංගෘහිතවිය. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සංඛ්‍යාත සකල ශාසනික සාධු ජනතාවට පරමශාන්ත සුඛාමෘතස්‍යන්දනය වන අමාවූලක් බඳුවූ මේ ධර්ම මාර්ගයෙන් නිවන්පුර පැමිණි දෙව් මිනිසුන්ගේ සංඛ්‍යාව ඉතා බොහෝ වෙයි. මෙයින් ප්‍රකාශිත ත්‍රිශික්ෂා පරිපූර කාරිත්වය ආදී සදර්ථ කෞශල්‍යය ශාසන පදීපනය දක්වා, සකල ශාසනික සාධූන්ගේ හස්තසාර වස්තුවක්වෙයි. අද දක්වාත් සියලු බෞද්ධජන සමූහයා විසින් අත්‍යාදරයෙන් සම්භාවිතවූ මේ මාහැඟි ධර්ම මාර්ගයෙන් අර්ථවශයෙන් අවබෝධ කොටගෙන භාවිතා කරනු ලැබේ නම් එයින් බෞද්ධලෝකයාට අත් පත්විය හැකි විපුලාර්ථ සිද්ධිය විස්තර කල නොහැකි මය. එහෙයින් නොවියත් සාධුජනයාට මේ ධර්ම මාර්ගයාගේ සුවසේ අර්ථාව බොධ කරගැනීමට සදුපාය මාර්ගයක් සලසාලුව හොත් මාහැඟි ලෝකශාසනොපකාරී පුණ්‍ය සම්පත්තියක් අත් පත්වන්නේයයි අපට හැඟුනේය. එහෙයින් අප **ජේතවනාරාමාධිපති** රාමඤ්ඤනිකායේ අධිකරණ විනිශ්චයකාරක සඞ්ඝ

# කරණීය මෙත්ත සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව.

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 කරණීයමත්ථ කුසලෙන,
යං තං සන්තං පදං අභිසමෙච්ච.

1 සන්තං, සියලු කෙලෙසුන් කෙරෙන් සන් සිඳුනාවූ; යං පදං, යම් අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණ පදයක්; (අත්ථි, ඇත්තේද;) තං පදං, ඒ නිර්වාණ පදයට, අභිසමෙච්ච, අරමුණු කිරීම් වශයෙන් පැමිණ; වාසය කරනු කැමැත්තාවූ; අත්ථකුසලෙන, ලෞකික ලොකොත්තරාර්ථයෙහි දක්ෂවූ කුල පුත්‍රයා විසින් (මේ වක්ෂ්‍යමාණවූ ප්‍රති පත්තික්‍රමය,) කරණීයං, කටයුත්තේයි.

මෙහි ‘යමක් කටයුතුය’යි කී තැන කටයුතුත් ඇත. නො කටයුතුත් ඇත. සංක්ෂෙපයෙන් ත්‍රිවිධ ශික්ෂාව කටයුතුය. ශීල විපත්ති, දෘෂ්ටි විපත්ති, ආචාර විපත්ති, ආජීව විපත්ති, ආදිය නොකටයුතුය. එසේම තමහට අභිවෘද්ධියෙහි දක්ෂවූ කුලපුත්‍රයා විසින් යයි කී තැන තමහට අභිවෘද්ධි කිරීමෙහි අදක්ෂයෙකුත් ඇත. දක්ෂයෙකුත් ඇත.

එහි යමෙක් මේ ශාසනයෙහි පැවිදිව මහාකොට ශාසන ප්‍රතිපත්තියෙහි නොයෙදේද, බිඳුණු සිල් ඇත්තේවේද, එක් විසි අනෙසනයෙන් ජීවිකාව කෙරේද,

ඒ එක්විසි අනෙසනය කවරේද? වේළුදානම් ආදියට වෙළුදානය, පත්‍රදානය, සපු දුනුකේ දෑසමන් ආදිවූ මල්දීමය, කොස් පොල් අඹ ආදිවූ ඵල දීමය, දැහැටි දීමය, මුවසෝදනා පැන්දීමය, ඇඟ උලන චූර්ණ දීමය, තත් තත් ප්‍රධානීයන්ට තත් තත් කාර්යයන්ට ප්‍රයෝජන මැටි දීමය, චාටුකම්‍යතාවය, මුග්ගසූප්‍යතාවය, පාරිභට්‍යතාවයයි, කියනලද දරුවන් නැළවීමය, ජඞ්ඝපෙසනිකය’යි, කියනලද පා මෙහෙවර කිරීමය, වෙදකම් කිරීමය, පත්හසුන් පඬුරු ආදිය ගෙන එතන මෙතන ඇවිදීමෙන් රජරාජ මහා අමාත්‍යාදීන්ට දූත මෙහෙවර කිරීමය, පහිණ ගමනය,යි කියනලද එගෙන් එගෙට ඇවිද කුඩා මහන් මෙහෙවර කිරීමය, මොවුන්ගෙන් ලද දෙය අනුන්ට දීමෙන් පිණ්ඩ ප්‍රති පිණ්ඩ දානානුප්‍රදානය, ශෙඛිම

ශාස්ත්‍ර කිමය, නැකත් කිමය, අඞ්ග විද්‍යාය, ශිල්ප විපත්තියට කාරණවූ වෙශ්‍යාවන් වැන්දඹුවන් ථුල්ල කුමාරිකාවන්, පණ්ඩකයන් භික්ෂුණීන් රාමසොඩින්ගෙන් යුත් පානාගාරයන් යන මෙතෙක් අගොචරයෙහි හැසිරේද, නැටන නැටවිතන් එළඹේද, රාජරාජමහාමාත්‍යයන් හා ඔවුන්ගේ භක්තිගත් තීර්ථක ශ්‍රාවකයෝය යන මෙකීවුන් හා නුසුදුසුවූ ගෘහස්ථ සංසග් වශයෙන් ඔවුන්ගේ සුවදුක් දෙක්හි එකතුව බැඳි වාසය කෙරේද, අතිකුදු මෙබඳුවූ බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධාදිය නැති ශාසනයට ප්‍රතිවිරුද්ධ උපාසකාදිවූ කුලයන්හා භජනාය පයිරුපාසනය කෙරේද, එබඳුවූ මහණ තෙමේ තමහට බොහෝ අවැඩ කිරීමෙහි යෙදුණු බැවින් අනාචාරයෙහි දක්ෂවූයේයයි දතයුතු.

යමෙක් වනාහි මේ ශාසනයෙහි පැවිදිව යහපත්ගුණයෙහි පිහිටාද බුදුරදුන් විසින් නින්දා කරනලද වෙළඳනාදි එක්විසි අනෙසනය හැර පිරිසුදු සීලයෙහි පිහිටනුකැමැත්තේ ශ්‍රද්ධාව මුල්කොට චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් ද්විවිධවූ ප්‍රාතිමොක්ෂ සංවර සීලයද, සිහිය මුල්කොට ඉන්ද්‍රිය සංවර සීලයද වීර්‍ය්‍යය මුල්කොට ආජීව පාරිසුද්ධි සීලයද, ප්‍රඥාව මුල්කොට ප්‍රත්‍යය ප්‍රත්‍යවෙක්ෂා කොට සෙවීමෙන් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයද, යන චතුපාරිසුද්ධි සීලය පුරාද, මේතෙමේ තමහට වැඩ කිරීමෙහි දක්ෂවූයේ වෙයි.

තවද යම් මහණෙක් සප්තාපත්ති ස්කන්ධය ශුද්ධකිරීම් වශයෙන් ප්‍රාතිමොක්ෂ සංවරයද, සදොරට හමුවූ ඇලුම් කටයුතු ඉෂ්ටාරම්මණයෙහි අභිධ්‍යාදිය නොඉපදවීම් වශයෙන් ඉන්ද්‍රිය සංවරයද, අනෙසන පරිවර්ජන වශයෙන් බුද්ධශ්‍රාවකාදිවූ නුවණැතියන් විසින් වර්ණනා කරනලද ආජීව පාරිසුද්ධියදැයි කියන ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් ප්‍රත්‍යය සන්නිශ්‍රිතයද, චතුර්විධ ඊර්‍ය්‍යාපථ පරිවර්තනයෙහි සාමීචිකාදිය කැලකිමෙන් චතුසම්පජඤ්ඤයද, යන මෙකී ගුණයන් සිද්ධකෙරේද, තමාහට වැඩ කිරීමෙහි දක්ෂවූයේ වෙයි.

තවද යමෙක් වනාහි උපොසාදකයයි කියනලද අලුකාරම්දිය නිසා කිලිටිවූ පිළි සුදුවේද, ජාරිකායයි කියනලද හලු නිසා කැටපත පිරිසිදුවේද, උල්කා මුඛය නිසා දැවීමෙන් රන් පිරිසිදුවේද, එමෙන්මැ යහපත් නුවණ නිසා ශීලය පිරිසිදු වෙයි කියා. නුවණ නමැති දියෙන් සිල් මල සෝදා ශුද්ධකරන

නේ සිල් පිරිසිදු කෙරේද, බිජුරක්නා කිරලක මෙන් වල් රක්නා සෙමරක මෙන එක පුතකු රක්නා මවක මෙන් එක ඇසක් රක්නකු මෙන් ඉතා අප්‍රමාදව තමාගේ ශීලය රකීද, යටත උදය සලකනුයේ සවල්පමාත්‍රවූද වරදක් නොද කීද, මේ වනාහි අධිකුශල නම්වේ.

තව්ද යමෙක් අවිප්‍රතිසාරවූ ශීලයෙහි පිහිටා ක්ලෙශ විෂ්කම්භණ ප්‍රතිපදාව පිළිගනීද, ඒ පිළිගෙන කිසුණු පිරියම් කොට සමාපත්ති උපදවාද, මේද අධි කුශල නම්වේ.

යමෙක් සමාපත්තියෙන් නැගී සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කොට අර්හත්වයට පැමිණේද, මේ තෙමේ තමාහට වැඩ කරන්නවුන් අතුරෙන් අග්‍රවේ. යම් පැවිදි කෙනෙක් අවිප්‍රතිසාරකර ශීලයෙහි පිහිටීම හෙතුකොටගෙන යම්තාක් ක්ලෙශ විෂ්කම්භණ ප්‍රතිපදාවත්ගේ පිළිගැන්මෙන් වර්ණනාකරන ලද්දාවූ අධි කුශලයෝද, මේතැනැහි මේ අධි යෙහි බහු අධි කුශලයෝය. හෙවත් තමන්හට වැඩ කිරීමෙහි අප්‍රමාද කිරීමෙහි දක්ෂයහයි කීයි.

මෙහි ශික්ෂණය කටයුතුයයි අතිසංක්ෂෙප දෙශනායෙන් සම හර කෙනකුන් නොදත් බැවින් ඔවුන්ට හගවනු පිණිස ආරණ්‍යක භික්ෂූන් විසින් යමක් විශෙෂයෙන් කටයුතුද, ඒ විස්තාර වශයෙන් දක්වනුවෝ.—

සක්කො උජූච සූජූච
සුවචො චස්ස මුදු අනතිමානී, යන උපාඩ ගාථාව දක්වූහ.

සක්කො අස්ස, දක්ෂවේවා; කුමකටයයත්? ශාන්තපදයට පැමිණ වසනු කැමති ආරණ්‍යක භික්ෂු තෙමේ උපන් අකුසල් නසන දෙවෙනි පධානියඞ්ගයෙන්ද, උපන් කුසල් රැකවඩා වර්ධකරන්නාවූ සතරවෙනි පධානියඞ්ගයෙන්ද, සමන්විත වීමෙන් කාය ජීවිත නොබලා කිසුණු පිරියම්හි වත් පිළිවෙත් පිරීමෙහි තමාගේ පාත්‍ර චීවර ප්‍රතිසංස්කරණයෙහි සබ්‍රම්සරුන් ගේ යම් ඒ කුඩා මහත් කටයුත්තක් ඇත්ද, එහි අනලස්ව සමඡීව දක්ෂවේවා;) උජු අස්ස,(එසේ දක්ෂවූ තමුත් ශඨප්‍රයොගි නොව) ඍජුවේවා; සුඋජු අස්ස, ඍජු වූයේද එකවිටෙක ඍජු වීමෙන් ඇතැයි සතුටුනොව දිවිහිමියෙන් නැවත නැවතත් ලිල් නොකිරීමෙන්) මනාව ඍජුවේවා; අමායා බැවින් හෝ මනාව ඍජුවේවා කායවචී වඞ්කාදක නැතිවීමෙන් හෝ ඍජුවේවා;

මනො; වඩිකය නැතිවීමෙන් මනාව සෘජුවේවා; නොහොත් තමා කෙරෙහි නැතිගුණ පහළ නොකිරීමෙන් සෘජුනම් වේවා; එසේ තමා කෙරෙහි නැති ගුණයෙන් උපන් ලාභය නොඉවසී මෙන් මනාව සෘජුවේවා; සුවචොවිසය, (අනුන් විසින් අවවාද කරන ලදුව.)

“තදහු පබ්බජිතො සන්තො-ජාතියා සත්ත වස්සිකො,
සො'පි මං අනුසාසෙය්‍ය සම්පටිච්ඡාමි මුද්ධනා,”

යනු මේ ශාසනයෙහි පිළිවෙත බැවින්) කීකරුවේවා; ඒ එසේමැයි. යම් පුද්ගලයෙක් මේ නොකටයුතුයයි කීකල නොසතුටුව කිමෙක්ද, නොප විසින් මාගේ කුමක් දක්නා ලද්දේද? කුමක් අසනලද්දේද? කවරෙක් අසාකිද? නොපගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ හෝ සන්දෘෂ්ට සම්භක්ත මිත්‍ර කෙනෙක් හෝ කිවුදැයි කියා හෝ නොප කැමැත්තක් කියව කරනහැටි මමදනිමියි සිතා කිසිවකුත් නොකියා හෝ තුෂ්ණීම්භාවයෙන් වෙහෙසාද, නැතහොත් ප්‍රදානාවයට කානගාවුවකින් මීදෙන පිණ්ස මෙන් එකී අවවාදය පිළිගත් සැටියක් කොට අගවා රැවටිලි කියා කිලෙස නොකොට ගිදිද, මෙබඳු ස්වභාව ඇති තැනැත්තේ විශෙෂාධිගමයට හෙවත් නිර්වාණයට ඉතා දුරුවන්නේය.

එසේ නොකීකරු නොව යමෙක් වනාහි වැඩට නිසි අවවාද කියනු ලබන්නේ ස්වාමින් වහන්සේ වදාළසේ යහපත තමාගේ වරදනම්, තමාගට නොපෙනෙන්නේය. නැවතත් මෙබඳු වරදක් දුටුවිට ඇසූවිට මා කෙරෙහි අනුකම්පාවෙන් වදාළහොත් ඉතා යහපතැයි කියා යළිත් සැක නැතිව සුදුසු තැන අවවාද කිරීමට ආරාධනා කෙරේද? බොහෝ දවසකින් මා විසින් ඔබවහන්සේ කෙරෙන් අවවාදයක් අසන ලදැයි සතුටු බස් කියාද, අවවාදවූ පරිද්දෙන් පිළිගෙන ඇදහිලි ඇතිව ඒ අවවාදය කෙරේද? එහි පිළිපදිද, මෙබඳුසුවච කීකරු තැනැත්තේ නිවන්දොර සමීපව සිටි බැවින් විශෙෂාධිගමයට ඉතා නුදුරුව සිටියේවෙයි.

මුදු අසය, ගිහින්ගේ දූත ව්‍යවහාරාදියෙහිම සම්බන්ධව මෘදු නොවන්නා බව මිස වත පිළිවෙතෙහි සර්ව්‍යිය බ්‍රහ්මචර්‍ය්‍යාව පිරිමෙහි මනාකොට දවනලද කාංචනයක් මෙන්) මෘදුව යොග ක්ෂෙමලව්වා; නොහොත් මුහුන හැකිලවීමෙන් බිම බලාගෙන

යසපත් සාධා නොකිරීමෙන් තද නොව මනාකොට බස්නට සාදනලද නොමික් පරිද්දෙන් මෘදු වෙවා (මෘදුවීම්සි සතුටු නොව) අනාභිමානී අසුස, (සැඩොල් දරුවකු මෙන් අනතිමානිවූ සිතින් වසන්නෙමියි කියා බුදුන් ඉදිරියෙහි සැලකොට මහපොළොව වෙවුල්වූ සැරියුත් මහතෙරුන්වහන්සේ සෙයින් ජාතිමානය නසන පිණිස උපාලි කපුවන් පලමුකොට පැවිදි කරවා යමුන්ගේ පාදපරිමර්දනාදි යටත් ක්‍රියාහෙහි පිහිටා මහලු පිළිවෙත් කරනසේ අප පසුව මහණකොට වඳල මැනවැයි බුදුන් ඉදිරියෙහි සැලකොට ඒව ප්‍රසන්නවූ බුදුන්ලවා සාධුකාරදෙවූ අනුරුඬ ආනන්දාදි ශාක්‍ය කුමරුවන්ගේ ජාතිමානී නොව ගොත්‍ර මානීනොව විද්‍යාමානී නොව බහුශ්‍රැත මානී නොව ජාති ගොත්‍රාදීන් අනුන්ටත් නීච ගයිා නොකොට) නිහතමානී වෙවා;

මෙසේ විශෙෂයෙන් ආරණ්‍යක භික්ෂූන් විසින් කටයුතු එය දෙශනයින් දක්වා තවද මත්තෙහි කටයුතු දක්වන්නාහු.

සන්තුස්සකො ච සුභරො ච,
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති,
සන්තින්ද්‍රියො ච නිපකො ච,
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො —යනුගිහු.

2 සන්තුස්සකො ච, (යථාලාභ යථාබල යථාසාරුප්ප වශයෙන් එක එක පසයකට තුනතුන බැගින් සිවුපසයට දොළසක්වූ ප්‍රභෙද ඇති සන්තොසයෙන් සතුටුවෙවා; (තොමෙහාන් වාදස විධෙන සන්තොසෙන සන්තුස්සතීති සන්තුස්සකො, අථවා තුස්සතීති තුස්සකො සකෙන තුස්සකො සන්තුස්සකො සන්තෙන තුස්සකොති සන්තුස්සකො, සමෙන තුස්සකොති, සන්තුස්සකො,යි යනාදීන් සන්තොෂවේනුයි 'තුස්සක' නම්. ස්වකීය දෙයින් හෙවත් තමාගේ දෙයින් තොෂවන්නෙන් 'සන්තුස්සක' නම්. සන්තය'යි කියනලද විද්‍යමාන දෙයින් තොෂවන්නෙන් 'සන්තුස්සක' නම් සමානකොට තොස්කරන්නේ 'සන්තුස්සක' නම්. ඒ සකතුස්සක, සන්තුස්සක, සමාන තුස්සක, යන තුනින් ස්වකීය දෙයනම්, උපසම්පදා මලුයෙහිදි උදෙසනලද තමා පිඩුපිණ්ඩ පැවිදිවෙමියි ප්‍රතිඥාත හෙයින් පිණ්ඩපාලොප භොජනය 'සක' නම් වෙයි.

ඒ ස්වකීයවූ පිණ්ඩපාලොප භොජනාදි සිවුපසයෙන් සුන් දරවූ හෝ අසුන්දරවූ සකස්වූ හෝ නොසකස්වූ හෝ දෙයකින්

පිළිගන්නා විටද වළඳන විටද විකාර නොදක්වා යැපෙන්නේ 'සන්තුස්සක' යයි කියනු ලැබෙයි.

විතීයාවියෙහි 'සන්ත' නම් තමහට ලද යම්දෙයක් විද්‍යමානනම් එය 'සන්ත' නම්. එයින්ම සතුටුවන්නේ එයින් මත්තෙහි අතිකක් නොපතන්නේ අනිච්ඡතාව දුරුකරන්නේ 'සන්තුස්සක' යයි කියනු ලැබේ.

තෘතීයාවියෙහි 'සමාන තුස්සක' නම් යහපත් දෙයෙහි ආලයකුත් නොකොට අයහපත් දෙයෙහි අමනාපයකුත් නොවී, අනුනය ප්‍රතිඝ දෙකම නොකොට ඉෂ්ටානිෂ්ට දෙකෙහි සමානව සතුටුවන්නේ 'සමාන තුස්සක' යයි කියනුලැබේ.

සුභරොච, (උපාසක ජනයා විසින් රුක්ෂවූ හෝ ප්‍රණීතවූ හෝ දෙනලද යම් ද්‍රව්‍යයකින් සුවසේ රක්‍ෂාකට හැකිව) සුභරවේවා; අප්ප කිච්චොච; කම්මාරාමතා, භස්සාරාමතා, සඞ්ගණිකාරාමතාදී අනෙක කෘත්‍යයෙහි ව්‍යාපෘත නොවේවා; නොහොත් සියලු විහාරයෙහි නවකම්ම්‍යාතවිධාන සාමණේරානුශාසනා සංඝභොග විචාරණාදී කටයුතු නැතිව තමාගේ කෙස නබවෙජ්ද පාත්‍ර පචන ජීවර කම්මාන්තාදී) අල්ප කෘත්‍ය ඇතිවේවා; සල්ලහුකවුත්ති; (යම්සේ ඇතැම් බහු භාණ්ඩික භික්‍ෂු කෙනෙක් යම් දිගකට යනකල්හි බොහෝවූ පාසිවුරු ඇතිරිලි තෙල් සකුරු ආදි දේ මහාජනයාලවා තඩ තඩ පොදි අඹිදිය බැඳසිසභාර කටිභාරාදි වශයෙන් උසුලවාගෙන නික්මෙත්ද? එසේනොව අල්ප පරිෂ්කාරික වේවා; හෙවත්—

පත්තො තිචිවර ඤ්චවට—වාසි සූචිච බන්ධනං,
පරිස්සාවනෙන අට්ඨෙතෙ-යුත්ත යොගස්ස භික්ඛුනො, යි

කියනලද අෂ්ට ශ්‍රමණ පරිෂ්කාර මාත්‍රයක් පරිහරණය කෙරේද? යම් දිගකට යනකල්හි පත්‍රභාර සහිතවූ සිත දිගකට නොපැකිල ඉගිලී යන ශකුන පක්‍ෂියකු සෙයින් සමාදන්වූ අටපිරිකර පමණක් ගෙන සැපසේයේද? මෙබඳු මහණතෙමේ මෙහි සල්ලහුක වුත්තිය හෙවත් ලඝුවූ ප්‍රවෘත්ති ඇත්තේයයි දක්වනුලැබේ.

(සන්තින්ද්‍රියොච) ඉෂ්ටානිෂ්ට ලම්බනයෙහි රාගවේෂ වශයෙන් උඩතවූ ඉඳුරන් ඇතිනොවූ) සන්සුන් ඉඳුරන් ඇතිවේවා; නිපකොච; (සිවුරු ගෙත්තම් කිරීම් ආදියෙහි පැවති

ප්‍රඥයෙන් ආවාසාදි සත් වැදෑරුම් සප්පාය දැනගන්නා ප්‍රඥයෙන් යුක්තවීමෙන්) ප්‍රඥවත් වේවා! අප්පගබ්භාච; (සඞ්ඝ ගණ පුද්ගල භොජනශාල। ජන්තාඝර නහාන තීර්‍ථ භික්ඛාචාර මග්ග අන්තර ඝරප්පවේසන, යන අටතන්හි කයින් නොසරුප් හිරිමය යන කාය ප්‍රගල්භයද, සංඝගණ පුද්ගල අන්තරඝර යන සතර තන්හි නොසරුප් තෙපුල් බිණීමය යන වාක් ප්‍රගල්භයද, සිතින් අනෙකප්‍රකාර කාම විතර්කාදිය සිතීමය යන මනඃ ප්‍රගල්භයද නැතිවේවා,.

(මෙහි 'පගබ්භ' යනු නොසරුප් බුහුටිකමට නම්) එහි කාය ප්‍රගල්භයට යට දැක්වූ අටෙහි පැවති නොසරුප් බුහුටිකම් කවරේද යත්?

මේ ශාසනයෙහි පිළිවෙත් සරු නොවන ඇතැම් පැවිදි කෙනෙක් සඞ්ඝ මධ්‍යයෙහි අතින් හෝ සිවුරෙන් හෝ අකවටු ලා හිඳිම් ආදි වශයෙන් ගෞරව නැතිවේද? එසේ ගෞරව නැතිව සඟමැද හා සිවුවණක් පිරිස් රැස්වන තැන හිඳිද, එසේම වෘද්ධතර පුද්ගලයන් කෙරෙහි ගරු නැතිව හිඳිද, බොජුන්හල වැඩිමහල්ලන්ට අසුන් නොදිම හා තමහට බාලවූ නවකයන් අස්නෙන් නැගිටුවාද, 'ජන්තාඝර' යයි කියනලද ගිනිහල්ගෙහි මහල්ලන් නොවිචාරා ගිනි මොලවාද, නහනතොට ළදරුය මහලුය යන නියමයක් නැතිව ආ ආ පිළිවෙළින් නැයුතුවෙයි. ඒ නොඅසා පසු අවුත් දියෑ ඉසිමින් මහල්ලන්ද නවකයන්ද වෙහෙසාද, භික්ෂාචාර මාර්ගයෙහි අග්‍රාසන අග්‍රොදක අග්‍රපිණ්ඩ පිණිස මහල්ලන්ට ඉදිරි ඉදිරිව යේද, අන්තරඝර ප්‍රවේශයෙහි මහල්ලන් අත් පහරමින් දුවම තරව ප්‍රවිෂ්ටවේද, ළදරුවකුමෙන් කායකිළනය කෙරේ දූයි යනාදි නොසරුප් ක්‍රියා කාය ප්‍රගල්භ නම්වේ.

වාක් ප්‍රගල්භ යටකී සතරෙහි යමෙක් සඞ්ඝ මධ්‍යයෙහි නොවිචාරා බණකියාද, එසේ කියනලද අයුරින් ගණමැද මහලු පුද්ගලයන් මැද නොවිචාරා පැනවිසඳද, ඇතුලු ගමෙහි වන්නාහු මෙනම් තැනැත්තිය කුමක් ඇත්ද, කැඳ කැවුම් ඇත්ද? බොජුන් ඇද්ද, මට කුමක් ඇත්ද, කුමක් අනුභව කරමෝදැයි යනාදින්දෙඩාද, මේවනාහි නුසුදුසු 'වාක්ප්‍රගල්භය නම්වේ. කායවාක් ප්‍රගල්භ නැත්තේද, ' මනසින් කාම විතර්කාදි අනෙක ප්‍රකාරවූ නොසරුප් විතර්ක සිතාද, මේවිනාහි 'මනඃ ප්‍රගල්භ' නම්වේ.

කුලෙසු අනනුගිද්ධො, කුලයෙහි නොඇලේවා; හෙවත් යම් උපාසක කුලයක් තමා විසින් භික්‍ෂාවට එළඹියයුතුද; ඒ කුලයෙහි ප්‍රත්‍යය තෘෂ්ණාවෙන් හෝ නොහොබනා ගිහි සංසගී වශයෙන් හෝ නොඇලේවා මෙහි නුසුදුසු ගිහි සංසගීයනම් ප්‍රත්‍යය දායකයන්ට ශොකයක් පැමිණිවිට අහෝ අපගේ ප්‍රත්‍යය දායකයාට පැමිණි ශොකයකැයි යනාදිය කියමින් තමාටවූ ශොකයක්මෙන් ඔවුන්ට ඇඟවීමෙන් ශොකයට එකතුවීමය. එසේම සතුටක් පත්වූ විටද ඊට එකතුවීමය. ඔවුන්ට උපන් කුඩා මහත් කටයුත්තෙහි තමා ව්‍යාපෘතව ඒ පිරිමැසීමය. මෙසේ මෙබඳුවූ ලාමක ක්‍රියාව හැර ළදරුකල පැවිදිවන්ට ගොස් බොහෝ කලකින් වැඩි බැවින් නොහඳුනන අතික් නමකැයි සිතා වස් තුන්මසක් උපස්ථානකළ මවුපියන්ට තමන් පුත්‍රබව නොහඟවා ගොස් ඒ මවුපියන්ගෙන් ප්‍රශංසා ලත් මහතාණන් ඇතුළුවූ උතුමන් සිහිකොට උපාසක කුලය කෙරෙහි නොඇලියයුතු.

මෙසේ සම්ඥයෝ ආරණ්‍යක භික්‍ෂූන් විසින් කටයුතු දක්වා නොකටයුතුද දක්වන්නාහු.

3 නච ඛුද්දං සමාචරෙ,
කිඤ්චි යෙන විඤ්ඤූපරෙ උපවදෙය්‍යුං.

යන උපාලී ගාථාව දැක්වූහු.

3 යෙන, යම් ක්‍රියාවකින්; විඤ්ඤූපරෙ, වියත්වූ අන්හු (හෙවත්) නුවණැති අන් කෙනෙක්; උපවදෙය්‍යුං, උපවාද කෙරෙත්ද; හෙවත් නින්දා කෙරෙත්ද? නචඛුද්දං සමාචරෙ කිඤ්චි, එසේවූ නිකෘෂ්ටවූ හෙයින් ක්‍ෂුද්‍රනම්වූ සවල්පවූද කිසි කායවාක් මනො යන දුශ්චරිතයක් නොකරන්නේයි.

අනුවණයෝ බොහෝය, ඔවුහු නින්දාවට සුදුසු තැන ප්‍රශංසා කෙරෙති. ප්‍රශංසාවට සුදුසු තැන නින්දා කෙරෙති. නුවණැත්තෝවූකලී මේ මහත්වූ වරදෙක, මේ කුඩාවූ වරදෙක යනාදින් විභාගකොට දැන විමසා නින්දාවට සුදුසු තැන නින්දාම කෙරෙති. ප්‍රශංසාවට සුදුසු තැන ප්‍රශංසාම කෙරෙති. එසේ හෙයින් "විඤ්ඤූපරෙ"යි කීහු.

මෙසේ ශ්‍රාවකයා විසින් කටයුතු නොකටයුතු දක්වා දෙවතාවන් විසින් වන භයින් මිදෙනු පිණිසද කමටහන් පිණිසද.

සුඛිනොවා ඛෙමිනො හොන්තු,
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.

යනාදී මෛත්‍රී කථා වදරන්නට ආරම්භ කොළෝ.

සබ්බෙ සත්තා, සියලු සත්ත්වයෝ; සුඛිනො හොන්තු, කායික සුවයෙන් සුව ඇතිවෙත්වා; ඛෙමිනො හොන්තු, භයොපද්‍රව රහිතව ක්ෂේම වෙත්වා; සුඛිතත්තා භවන්තු, සුඛිත සිත් ඇතිවෙත්වා; මෙසේ සංක්ෂෙපයෙන් මෛත්‍රී භාවනාදක්වා විස්තර විසිනුත් දක්වනුපිණිස ද්විකත්‍රිකප්‍රභෙද ඇති "යෙකෙචි" යනාදී ගාථාවය කියනලදී.

4 යෙකෙචි පාණ භූතත්ථි-තසාවා ථාවරාවා අනවසෙසා,
දීඝාවායෙ මහන්තාවා-මජ්ඣිමා රස්සකාණුක ථූලා.

4. තසාවා, ත්‍රස්තවන හෙයින් තසනම්වූ කෙලෙශ් සහිත සත්හුද; ථාවරාවා, ප්‍රහීණ ගමන් ඇති හෙයින් ථාවර නම්වූ නිකෙලශි සත්හුද; අනවසෙසා, නිරවශෙෂවූ; යෙකෙචි, යම් කිසි; පාණභූතා, ප්‍රාණීහුයයි කියනලද කෙනෙක්; අත්ථි, ඇත්ද; සබ්බෙ සත්තා, ඒ හැම සත්හු; සුඛිතත්තා භවන්තු, සුඛිතවූසිත් ඇත්තාහු වෙත්වා; දීඝාවා, නාගගොධාදි යොදුන් ගණන් දිග ඇති සත්හුද; යෙ මහන්තාවා, රාහු අසුරේන්ද්‍රාදිවූ යම් මහත් ආත්මභාව ඇත්තාහුද; මජ්ඣිමා, අශ්ව ගවාදි මධ්‍යම සත්හුද; රස්සකා, වාමනාදිහුද; අණුක, මාංස චක්ෂුසට නොපෙනෙන ජලාදියෙහි උපදනා සිහින් සූක්ෂම සත්හුද; ථූලා, වටවූ කැසුබ් ආදි සත්හුද.

5 දිට්ඨාවායෙව අද්දිට්ඨා-යෙචදූරෙ වසන්ති අවිදූරෙ,
භූතාවා සම්භවෙසීවා-සබ්බෙසත්තා භවන්තු සුඛිතත්තා.

5 දිට්ඨාවා, චක්ෂුසට පෙනෙන සත්හුද; අද්දිට්ඨාවා, පරසක් වල ආදියෙහි නොපෙනෙන සත්හුද; යෙචදූරෙ වසන්ති, යම් සත්ත්ව කෙනෙක් (තමාගේ ශරීරයෙන්) පිටත්තන්හි වෙසෙද්ද? භූතාවා, භූතනම්වූ යම් සත්ත්ව කෙනෙක් ඇද්ද? සම්භවෙසීවා, සම්භවෙසී නම් යම් සත්ත්ව කෙනෙක් ඇත්ද?

මෙහි "භූත" ශබ්දයෙන් වූවහු කියති. හෙවත් උපන් සත්ත්වයෝ කියනු ලැබෙති "සම්භවෙසී" ශබ්දයෙන් වෙමින් සිටියාවූ හෙවත් උපදිමින් සිටියාවූ සත්තවයෝ කියනු ලැබෙත්. එසේවූවන් වෙමින් සිටියවුන් දැනඹවුන් කෙරෙහි මෙත් පතුරුවනු පිණිස.

6 නපරොපරං නිකුබ්බෙථ-නාතිමඤ්ඤෙථ කත්ථචිනං කඤ්චි,
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා-නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛ
මිච්ඡෙය්‍ය, යනු කීහු.

6 කත්ථචි, (ග්‍රාමාදි) කිසි තැනෙක්හි; නොහොත් මහාජන මධ්‍යයෙහි; පරො, අනිකෙක්; පරං, අනිකකු; නනිකුබ්බෙථ, වංචා නොකෙරේවා නොපෙළේවා; නංකංචි, ඒ කිසිවක්හට; නාති මඤ්ඤෙථ, අවඥ නොකෙරේවා; බ්‍යාරොසනා, කාය වාක් විකාරයෙන්වූ රොෂණයෙන්ද; පටිඝසඤ්ඤා, මනො විකාරයෙන්වූ ප්‍රතිඝ සංඥාවයෙන්ද; අඤ්ඤ මඤ්ඤස්ස, ඔවු නොවුන්ට; දුක්ඛං නඉච්ඡෙය්‍ය, දුක් නොකමැති වේවා;

දැන් මෛත්‍රී භාවනාව උපමා නයින් දක්වනුවෝ.

7 මාතා යථානියං පුත්තං-ආයුසා එකපුත්තමනුරක්ඛෙ,
එවම්පි සබ්බ භූතෙසු-මානසම්භාවයෙ අපරිමාණං.
යනු කීහු.

7 මාතා යථා, මවු යම්සේ; ආයුසා, ආයුෂයෙන්ද; හෙවත් ඒ ඒ උපද්‍රවයකින් ගලවා ගන්නා පිණිස ජීවිතයත් නොතකා උත්සාහ කිරීමෙන්; එකපුත්තං, එකම පුත්‍රවූ; නියංපුත්තං, ඖරස පුත්‍රයා; අනුරක්ඛෙ, රකිද? එවම්පි සබ්බ භූතෙසු, එසෙයින් හැම සතුන් කෙරෙහි; අපරිමාණං, අප්‍රමාණවූ; මාන සම්භාවයෙ, මෙත් සිත වඩන්නේයි.

දැන් මෛත්‍රී භාවනාක්‍රම දක්වන්නාහු.

8 මෙත්තංච සබ්බලොකස්මිං-මානසං භාවයෙ අපරිමාණං,
උද්ධං අධොච තිරියංච-අසම්බාධං අවෙරං අසපත්තං.
යනු දැක්වූහු.

8 අපරිමාණං, අප්‍රමාණවූ හෙවත් අනන්ත සත්තවාලම්බන හෙයින් පමණ නැති; අසම්බාධං, සතුරු මිතුරු දෙපක්ෂයටම එකාකාරව පවත්නා හෙයින් සම්බාධ නැති; අවෙරං, වෛර චෙතනා නැති; අසපත්තං, සතුරන් නැති; මානසං, සිත්හිවූ; මෙත්තංච, මෛත්‍රියද; උද්ධං, උඩ; අධො, යට; තිරියං, සරස; සබ්බ ලොකස්මිං, සකල සත්තවලොකයෙහි; භාවයෙ, වඩන් නේයි;

දැන් මෛත්‍රී කම්ඨානයාගේ වශිතා ප්‍රාප්තිය දැක්වීම්වස්.

යත්ට ප්‍රියවූ ඒ නිර්වාණ පදයට පැමිණ වාසයකරනු කැමති නුවණැති ජනතෙමේ නිර්මල ශීලසමාධි ප්‍රඥාභෙද ඇති ඒ කරණීයාර්ථය හෙවත් කටයුතු ත්‍රිශික්‍ෂා පරිපූරණය අනාවරත මයත් කරන්නේය

**කරණීය මෙත්ත සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව සමාප්තයි.**

---

## කරණීය මෙත්ත සූත්‍රයේ නිදාන කථාව.

හිමවත් පසෙහි වනාහි දෙවතාවන් විසින් උපද්‍රැතවූ භික්ෂූහු සැවැත් නුවර වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹියාහුය.

ඔවුන්ට පිරිත් පිණිසද කර්මටහන් පිණිසද සම්බුද්ධයන් වහන්සේ මේ සූත්‍ර ධර්මය වදාළසේක.

මේ සංක්‍ෂෙපයයි:-

**මේ වනාහි විස්තරයවේ.**

එක්සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ වස් එළඹෙන කාලය ළංවූකල සැවැත්නුවර වැඩ වසනසේක. එසමයෙහි නොයෙක් රටවාසිවූ බොහෝ භික්ෂූහු භාග්‍යවත් බුදුන් සමීපයෙහි කමට හන්ගෙන ඒ ඒ තන්හි වස් එළඹෙනු කැමැත්තාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙත්. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ රාගචරිතයන්ට සවිඤ්ඤාණක අවිඤ්ඤාණක විසින් එකොළොස් වැදෑරුම් අසුභ කමටහන්ය. ද්වෙෂ චරිතයන්ට සතර වැදෑරුම්වූ මෙත් ආදි කමටහන්ය, මෝහ චරිතයන්ට මරණානුස්මෘති ආදි කමටහන්ය, විතර්ක චරිතයන්ට ආනාපාන සති පඨවි කසිනාදි කමටහන්ය, ශ්‍රද්ධාචරිතයන්ට බුද්ධානුස්මෘති ආදි කමටහන්ය, බුද්ධි චරිතයන්ට සතරධාතු ව්‍යවස්ථානාදි කමට හන්ය, යන මේ ක්‍රමයෙන් සුවාසූදහසක් ප්‍රභෙද ඇති චරිතානුකූලවූ කමටහන් වදාරනසේක.

ඉක්බිත්තෙන් පන්සියක් පමණ භික්ෂූහු බුදුන්ගේ සමීපයෙහි කමටහන්ගෙන සැපවූ සෙනස්නක්ද ගොදුරුගමක්ද සොයමින් ක්‍රමයෙන් වඩනාහු ප්‍රත්‍යන්තයෙහි හිමාලය වනයහා එකාබද්ධවූ නිල්කද්මිණි වැනි ගල්තලා ඇති සීතලවූ ඝන ඡායා ඇති නිල්වන ලැහැබින් හෙබියාවූ මුතුඇල් රිදීපටවැනි

හෙලවැල්ලෙන් ගැවසුණාවූ භූමිභාග ඇති පිරිසුදු සුවපහස් සිහිල්දිය පිරුණු ජලාශයෙන් පිරිවරනලද පර්වතයක් දුටුවාහුය.

ඉක්බිත්තෙන් ඒ භික්ෂූහු එහි එක් රැයක් වාසයකොට රැය පහන්වූ කල්හි සිරුරුපිරියම්කොට ඊට නුදුරුතන්හි එක්තරා ගමකට පිඬු පිණිස වන්හ. ඒ ග්‍රාමය ඝනව පිහිටියාවූ කුලදහසකින් යුක්තය. එහි මනුෂ්‍යයෝද ශ්‍රද්ධා සම්පන්නයෝය. පසල් දනව්වෙහි පැවිදිවරුන් දක්නට දුර්ලභ බැවින් ඒ මනුෂ්‍යයෝ භික්ෂූන් දැකම හටගත් ප්‍රීති සොම්නස් ඇත්තාහු දන්වලදවා, වහන්ස! තුන්මස මුළුල්ලෙහි මෙහිම විසුව මැනවයි යාඥාකොට පධානකුටි පන්සියක් කරවා එහි ඇඳ පුටු හා පානීය පරිභොජනීයවූ පැන් ගන්නා කළ කොතලා ආදි සියලු උපකරණයන් පිළියෙළ කළාහුය.

භික්ෂූහු දෙවන දවසෙහි අනිත් ගමකට පිඬු පිණිස වන්හ. එහිද මනුෂ්‍යයෝ එසේම උපස්ථානකොට වස් විසීමට යාච්ඤා කළාහුය. භික්ෂූහු අන්තරායක් නැතහොත් වසම්හයි ඉවසා ඒ වනලැහැබට පිවිස මුළු රෑ දෙවෙහි ආරබ්ධ වීර්‍ය්‍ය ඇතිව යාම ඝණ්ඨාව ගසා යොනිසො මනසිකාර බහුලව වාසය කරන්නාහු වෘක්ෂමූලයන්කරා එළඹ වැඩහුන්නාහුය.

සිලවන්ත භික්ෂූන්ගේ තෙජසින් නටුවාවූ තෙජස් ඇති වෘක්ෂ දෙවතාවෝ තම තමාගේ විමනින් බැස දරුවන්ගෙන ඔබ්මොබ හැසිරෙති. යම්සේ වනාහි ගමෙහි නවාතැනට පැමිණි රජුන් විසින් හෝ රජමහ ඇමතියන් විසින් හෝ ගම්වාසින්ගේ ගෘහයන්හි අවකාශ ගත්කල ගෘහවාසි මනුෂ්‍යයෝ ගෘහයෙන් නික්ම අන්‍යස්ථානයෙක වෙසෙත්ද! කවර කලෙක්හි යෙද්දෙ හෝයි! දුරසිට බලත්ද! එපරිද්දෙන්ම දෙවතාවෝ තමන්ගේ විමන්හැර ඔබ මොබ හැසිරෙන්නාහු පින්වතුන් වහන්සේලා කවර කලෙක යෙද්දෙහෝයි! දුරසිට බලත්.

ඉක්බිත්තෙන් මෙසේද සිතුවාහුය. පෙර වස් එළඹියාවූ භික්ෂූහු අවශ්‍යයෙන් තුන්මසක් වෙසෙති අපි වනාහි එපමණ කලක් දරුවන් ගෙන ඉවත්ව වසන්ට නොහැක්කමු. එබැවින් අපි භික්ෂූන්ට භය උපදනා ආරම්මණ දක්වම්හයි. මෙසේ සිතා ඒ දෙවතාවෝ රාත්‍රි භාගයෙහි භික්ෂූන්ගේ මහණදම් කරන වේලාවෙහි බිහිසුණු කය ඇති යක්වෙස් මවා ඉදිරියෙහි සිටිති.

බියකරු හඬද කෙරෙති. ඒ බිහිසුණු රූපයන් දැකීමෙන්ද ඒ හඬ ඇසීමෙන්ද භික්ෂූන් ළය චචලවිය. දුර්වර්ණව පඬුවන්ද වූවාහුය.

එහෙයින් භික්ෂූහු සිත එකඟකරන්ට නොහැකිවූහ. නොඑකඟසිත් ඇත්තාවූ නැවත නැවත බියෙන් කලකිරුණාවූ ඒ භික්ෂූන්ගේ සිහිය මුළාවිය. ඉක්බිති මුළාවූ සිහි ඇති භික්ෂූන්ට දුර්ගන්ධවූ ආරම්මණ යෙදූවාහුය. භික්ෂූන්ගේ හිස් මුල් ඒ දුගඳින් අලලන්නාක් වැනිවිය. බලවත් වේදනා උපන.

එතකුදු වුවත් එපවත් ඔවු නොවුන්ටත් නොකීවාහුය. නැවත එක්දිනක් සංඝස්ථවිරයන්ට උපස්ථාන කරන වේලෙහි රැස්වූහ. එකලැ සඞ්ඝස්ථවිර ඇවැත්නි; මේ වනලැහැබට පැමිණියාවූ තොපගේ සිවි පැහැය කිපදිනක් ඉතා පිරිසුදු වූයේය. ප්‍රභාස්වර වූයේය. ඉන්ද්‍රියෝ අතිශයින් ප්‍රසන්නවූහ.

දැන් වනාහි කෘශවැ දුර්වර්ණවැ සුදුමැලි වූවාහුය කිමෙක්ද! තොපට මෙහි නොසැපදැයි විචාළේක.

ඉක්බිති එක් භික්ෂු කෙනෙක් මෙසේ සැල කරන්නේ වහන්ස! මම රාත්‍රියෙහි මෙබඳු මෙබඳු බියකරු අරමුණු දක්නෙම්ද වෙමි. අසන්නෙම්ද වෙමි. මෙබඳු ගඳකුත් ආඝ්‍රාණය කෙරෙමි.

එසේ හෙයින් මාගේ සිත එකඟ නොවේයයි කීයේය. මේ නියායෙන් සියලුදෙන එපවත් සැල කළාහුය. එකලැ සංඝස්ථවිරතෙමේ ඇවැත්නි! බුදුන් විසින් වස්සූපනායිකා දෙදෙනෙක් පණවනලදහ. අපටද මේ සෙනස්න නොසැපය.

ඇවැත්නි, භාග්‍යවත්හුගේ සමීපයට යම්හ. එසේ ගොස් අන්‍ය සප්පාය සෙනාසනයක් විචාරම්හයි කීසේක.

යහපත වහන්සැයි ඒ භික්ෂූහු මහතෙරුන්ගේ වචනය අසා හැමදෙනම සෙනසුන් තැන්පත්කොට පා සිවුරුගෙන කුලයා කෙරෙහි නොඇලුණු බැවින් කිසිවක් හටන් කථා නොකොටම යම් තැනෙක සැවත් නුවරද ඒ දිසාවට සැරිසරා වැඩියාහුය. ක්‍රමයෙන් සැවැත් නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹියාහුය. බුදුහු ඒ භික්ෂූන් දැක මෙපවත් විචාළහ.

මහණෙනි, වස්සානය ඇතුළත චාරිකා නොකටයුතුයයි මා විසින් ශික්ෂාපදය පණවන ලද්දේය. තෙපි කුමට සැරිසරව් දැයි විචාළහ. ඒ භික්ෂූහු සියලු පවත් බුදුන්ට සැලකළාහුය. බුදුහු ආවර්ජනා කරනසේක් මුළු දඹදිව්හි යටත් පිරිසෙයින් සතර පාපුටුවක් තබන තැනක් පමණවූද ඒ භික්ෂූන්ට සුදුසු අන්‍ය සෙනාසනයක් නුදුටුසේක.

ඉක්බිති ඒ භික්ෂූන්ට මෙසේ වදාළහ. මහණෙනි, තොපට අන්‍ය සප්පාය සෙනාසනයක් නැත. එහිම වාසය කරන්නාවූ තෙපි රහත් බවට පැමිණෙන්නහුය. යව මහණෙනි, එම සෙනසුන ඇසුරුකොට වාසය කරව. ඉදින් වනාහි දෙවියන්ගෙන් අභය කැමැත්තහුනම් මේ පිරිත උගනුව. මේ වනාහි තොපට පිරිත්ද කමටහන්ද වන්නේයයි මේ සූත්‍ර ධර්මය වදාළහ.

අන්‍යාචාර්‍ය්‍යයෝ මෙසේත් කියති.

මහණෙනි, යව එම සෙනස්න ඇසුරුකොට වාසය කරවයි බුදුහු මේ සුතුර වදාළහ. යළිදු වනාහි ආරණ්‍යකයා විසින් පරිහරණය දතයුතුය.

ඒ කවරේද? උදය සවස භාවිත කිරීම් වශයෙන් මෙත් දෙකෙක, පිරිත් දෙකෙක, අසුභ දෙකෙක, මරණ සති දෙකෙක, ජාති, ජරා, ව්‍යාධි, මරණ, සතරඅපාය දුඃඛයෝදැයි අෂ්ට ප්‍රකාරවූ නොහොත් ජාති, ජරා, ව්‍යාධි, මරණ, අපාය දුඃඛ අතීත වෘත්ත මූලක දුඃඛ අනාගත වෘත්තමූලක දුඃඛ ප්‍රත්‍යුත්පන්න ආහාර පර්‍ය්‍යේෂණ දුඃඛයයි අෂ්ටවිධවූ සංවේග වස්තූහුදැයි මෙසේ බුදුහු පරිහරණය වදාරා ඒ භික්ෂූන්ට මෙත් පිණිසද විදර්ශනා පාදක ධ්‍යාන පිණිසද, මේ සූත්‍රය වදාළහ. මෙහි නිදාන කථාවයි.

## කරණීය මෙත්ත සූත්‍රයේ සංක්ෂේප භාවය.

1 ශාන්තපද සංඛ්‍යාත නිර්වාණ පදයට ප්‍රතිවෙධ වශයෙන් පැමිණ වසනු කැමැත්තහු විසින් යමක් කටයුතුද තමාගේ අභිවෘද්ධියෙහි දක්ෂයා විසින් ඒ කටයුතුයි.

ශාන්තපදයට පැමිණ වසන ආරණ්‍යක භික්ෂුතෙමේ උපන් අකුසල් නසන දෙවෙනි පධානියඞ්ගයෙන්ද උපන් කුසල් වඩා බෝ කරන්නාවූ සතරවෙනි පධානියඞ්ගයෙන්ද සුකුනු

මෙන් කාය ජීවිතදෙක නොබලා කිපුණු පිරියම්හි වත් පිළිවෙත් පිරිමෙහි තමාගේ පාත්‍රචීවර ප්‍රතිසංස්කරණයෙහි සබ්‍රම්සරුන්ගේ යම් ඒ කුඩා මහත් කටයුත්තෙක් ඇද්ද එහි අනලසව සමර්ථව දක්ෂවේවා. එසේ දක්ෂවූ නමුත් ශඨප්‍රයොගී නොව සෘජුවේවා. සෘජුවූයේද එකවරෙකැ සෘජුවීමෙන් ඇතැයි සතුටුනොවැ දිවිහිමියෙන් නැවත නැවතත් ලිහිල් නොකිරීමෙන් මනාව සෘජුවේවා. අමායාවී බැවින් හෝ මනාව සෘජු වේවා, කාය වචී වඞ්ක දෙක නැතිවීමෙන් හෝ සෘජු වේවා, මනො වඞ්කය නැතිවීමෙන් මනාව සෘජුවේවා, නොහොත් තමා කෙරෙහි නැතිගුණ පහළ නොකිරීමෙන් සෘජු නම් වේවා, එසේ තමා කෙරෙහි නැති ගුණයෙන් උපන් ලාභය නොඉවසීමෙන් මනාව සෘජුවේවා.

ගිහින්ගේ දූත ව්‍යවහාරාදියෙහිම සම්බන්ධවැ මෘදු නොවන බවම්ස වත පිළිවෙතෙහි සවකිය සක්කිය බ්‍රහ්මචර්‍ය්‍යාව පිරීමෙහි මනාකොට දවනලද කාවනයක් මෙන් මෘදුව යොග ක්ෂෙම වේවා, නොහොත් මුහුණ හැකිලවීමෙන් බිම බලාගෙන යහපත් කථා නොකිරීමෙන් තදනොවැ මනාකොට බසින්නට සාදනලද තොටක් මෙන් මෘදුවේවා, මෘදුවීමිසි සතුටුනොව සැඬොල් දරුවකු මෙන් අනතිමානීවූ සිතින් වසන්නෙමියි බුදුන් ඉදිරියෙහි සැලකොට මහපොළොව වෙවුල්වූ සැරියුත් මහතෙරුන් වහන්සේ සෙයින් ජාතිමානය නසන පිණිස උපාලි කපුවන් පළමුකොට පැවිදිකරවා ඔවුන්ගේ පාද පරිමර්දනාදිවූ යටත් ක්‍රියායෙහි පිහිටා මහලු පිළිවෙත් කරනසේ අප පසුව මහණකොට වදාළමැනවයි බුදුරදුන් ඉදිරියෙහි සැල කොට එයට පහන්වූ බුදුන්ලවා සාධුකාර දෙවූ අනුරුද්ධ ආනන්දාදි ශාක්‍ය කුමරුවන්සේ ජාතිමානී නොව ගොත්‍රමානී නොව විද්‍යාමානී නොව බහුශ්‍රැතමානී නොව ජාති ගොත්‍රාදීන් අනුන්ටත් නින්‍ද ගර්හා නොකොට නිහතමානී වේවා.

2 යථාලාභ යථාබල යථාසාරුප්‍ය වශයෙන් එක එකපසය කට තුන තුන බැගින් සිවුපසයට දොළොසක්වූ ප්‍රභෙද ඇති සන්තොෂයෙන් සතුටුවේවා උපාසක ජනයා විසින් දෙනලද රූක්ෂවූ හෝ ප්‍රණීතවූ හෝ යම් ප්‍රත්‍යයකින් සුවසේ රක්ෂාකට හැකිවැ සුභරවේවා, කම්මාරාමතා, භස්සාරාමතා, සඞ්ගණිකාරාමතාදි අනෙක කෘත්‍යයෙහි ව්‍යාපෘත නොවේවා. නොහොත් සියලු විහාරයෙහි නවකර්මාන්තවිධාන සාමණේරානුශාසනා සඞ්ඝභොග විචාරණාදි කටයුතු නැතිව තමාගේ කෙශ නඛච්ඡේද පාත්‍ර පචන සිවුරු කර්මාන්තාදි ස්වල්පවූ කෘත්‍ය ඇතිවේවා.

යම්සේ ඇතම් බහුභාණ්ඩික භික්ෂුකෙනෙක් යම් දිශාවකට යන කල්හි බොහෝවූ පා සිවුරු ඇතිරිලි තෙල් සකුරු ආදිය මහාජනයා ලවා තඩ කඳ පොදි ආදිය බැඳ සිසභාර කටිභාරාදී වශයෙන් උසුලවාගෙන නික්මෙත්ද, එසේනොව අල්ප පරිෂ්කාරිකවේවා.

ඉෂ්ටානිෂ්ටාලම්බනයෙහි රාගවෙෂ වශයෙන් උඩතවූ ඉඳුරන් ඇතිනොවැ සන්සුන් ඉඳුරන් ඇතිවේවා. සිවුරු ගෙත්තම් කිරීම් ආදියෙහි පැවති ප්‍රඥයෙන් ශීලානුරක්ෂණ ප්‍රඥයෙන් ආවාසාදි භූත්වැදූරුම් සප්පාය දනගන්නා ප්‍රඥයෙන් යුක්තවීමෙන් ප්‍රඥවත්වේවා.

සංඝ, ගණ, පුද්ගල, භොජනශාලා, ජන්තාඝර, නහාන තිත්, භික්ඛාචාර මග්ග, අන්තරඝරප්ප වෙසන, යන අටතන්හි කයින් නොසරුප් කිරීමය යන කායප්‍රගල්භයද, සංඝ, ගණ, පුද්ගල, අන්තරඝර, යන සතර තන්හි නොසරුප් තෙපුල් බිණීමය යන වාක් ප්‍රගල්භයද, සිතින් අනෙකප්‍රකාර කාම විතර්කාදිය සිතීමය යන මනඃ ප්‍රගල්භයද, නැතිවේවා. කුලයා කෙරෙහි නොඇලේවා. හෙවත් යම් ඒ උපාසක කුලයක් තමා විසින් භික්ෂාවට එළඹිය යුතුද? ඒ කුලයෙහි ප්‍රත්‍යය තෘෂ්ණාවෙන් හෝ නුසුදුසු ගිහි සංසග්ගී වශයෙන් හෝ නොඇලේවා.

3 යම් ක්‍රියාවකින් නුවණැති අන් කෙනෙක් උපවාද කෙරෙද්ද? හෙවත් නින්ද කෙරෙද්ද, එසේ ක්‍ෂුද්‍රවූ ස්වල්ප වූද කිසි කායවාක් මනො දුශ්චරිතයක් නොකරන්නේය. හැම සත්හු කායික සුවයෙන් සුවඇතිවෙත්වා භයොපද්‍රව රහිතව ක්‍ෂෙම වෙත්වා. මානසික සුවයෙන් සුඛිතවූ සිත් ඇතිවෙත්වා.

4 ත්‍රාසනවන හෙයින් තසනම්වූ කෙලෙස් ඇති සත්හුද, ප්‍රහිණ ගමන්ඇති හෙයින් ථාවර නම්වූ නිඃකෙලශ සත්හුද, යම්කිසි ප්‍රාණීහයි කියනලද සත්ත්වකෙනෙක් ඇත්ද, ඒ සියලු සත්හු සුඛිතවූ සිත් ඇතිවෙත්වා. නාග ගොධාදි යොදුන් ගණන් දිගඇති සත්හුද, රාහු අසුරෙන්ද්‍රාදි යම් මහත් ආත්මභාව ඇත්තාහුද, අශ්වගවාදි මධ්‍යමයෝද, වාමනාදීහුද, මාංස චක්ෂුසට නොපෙනෙන ජලාදියෙහි උපදනා සින් සූක්ෂම සත්හුද, වටවූ කැසුබ් ආදි සත්හුද.

5 චක්ෂුසට පෙනෙන සත්හුද, පරසක්වල ආදියෙහි නොපෙනෙනා සත්ත්වයෝද, යම්සත්ත්වකෙනෙක් තමාගේ ශරීරයෙන් පිටත් තැන්හි වෙසෙත්ද! සමීපසථවූ ශරීරයෙහි වෙසෙද්ද!

භූතභූතවූ යම් සත්භවකෙනෙක් ඇත්ද? සම්භවේසී නම් යම් සත්තවකෙනෙක් ඇත්ද? ඒ සියලු සත්තවයෝ සුඛිත වෙත්වා.

6 ග්‍රාමාදි කිසි තැනෙක්හි නොහොත් මහාජන මධ්‍යයෙහි අනිකෙක් තෙමේ අනිකකු වංචා නොකෙරේවා. නොපෙලාවා, ඒ කිසිවක්හට අවඥ නොකෙරේවා, කාය, වාග්, විකාරයෙන්වූ රොසනයෙන්ද, මනො විකාරයෙන්වූ ප්‍රතිඝසංඥයෙන්ද, ඔවුනොවුන්ට දුක්නොකැමැති වේවා.

7 යම්සේ මවුතොමෝ ආයුෂයෙන්ද, හෙවත් ඒ ඒ උපද්‍රව යෙන් ගලවා ගන්නා පිණිස ජීවිතයත් නොතකා උත්සාහ කිරීමෙන් එකම ඖරස පුත්‍රයා රකීද? මෙසෙයින් හැම සතුන් කෙරෙහි අප්‍රමාණවූ මෛත්‍රිය වඩන්නේයි.

8 අපමණවූ හෙවත් අනන්ත සත්තවාලම්බන හෙයින් ප්‍රමාණ නැති සතුරු මිතුරු දෙපක්ෂයටම එකාකාරව පවත්නා හෙයින් සම්බාධනැති වෛර චෙතනා නැති සතුරන් නැති මෙත්‍රි සිත උඩයට සරස සියලු සත්තවලොකයෙහි වඩන්නේයි.


9 සිටින්නේද, යන්නේද, හිදින්නේද, හෝනේද, හෙවත් ස්ථාන ගමනාදි ඉරියව් කරමින් යම්තාක්කල් නොනිදද, හෙවත් පහවූ නිද්‍රා ඇත්තේද, ඒතාක් මේ මෛත්‍රි ස්මෘතිය වඩන්නේයි.

"සුඛිනොවා ඛෙමිනො" යන තැන පටන් "එතංසතිං අධිඨෙය්‍ය" යනතැන කෙළවරකොට වර්ණනා කරනලද මේ විහාරය හෙවත් මේ කී ලෙසින් මෛත්‍රීන් විසීම මේ ශාසන යෙහි තමහටද අන්හටද අභිවෘඪි ජනක හෙයින් උතුම්වූ ශ්‍රෙෂ්ඨ බ්‍රහ්ම විහාරයයි බුධාදීහු කීහු.

10 දෘෂ්ටියටද නොපැමිණ හෙවත් මෙසේ වර්ණිතවූ ස්වභාව ඇති මෛත්‍රි ධ්‍යානයට සමවැද එයින් නැගී එහි ඇති ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් නාමරූප පරිග්‍රහකොට හෙවත් සිතත් කයත් දෙක සොයා ශුඩවූ සංස්කාර රාශියක් මිස සත්තවයෙක් නැතැයිද්නමෙන් දෘෂ්ටියට නොපැමිණ ප්‍රථම මාර්ගයෙහි සම්පත් දෘෂ්ටියයි කියනලද දර්ශනයෙන් යමන්විත වූයේ වස්තුකාම කෙලශකාමයෙහි ගිජුබව ශකෘදගාමී මාර්ග යෙන් තුනීකොට අනාගාමී මාර්ගයෙන් නිරවශෙෂයෙන් ප්‍රහීණ කොට ඒකාන්තයෙන් මවුකුස පිළිසිඳ ගැන්මට නැවත නො එන්නේයි. ශුඩාවාසයෙහිදීම පිරිනිවන් පානේය. යනුභාවයි.)

සි ව ම ස්තු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු